# මහින්දට අත දෙන්නට මහින්ද රජයට එක්වෙයි

## රනිල් වික්‍රමසිංහ ගේ අවාසනාව එජාපයේ අවාසනාව බවට පත්වුණි ද?



**නව වසරේ** ගෙවී ගිය සති කිහිපය මෙරට දේශපාලනයේ නැවුම් දේශපාලන සිදුවීම් ගණනාවකට මුල පිරූ සිද්ධීන් කිහිපයක්ම හටගත් කාලයක් මෙන්ම බලාපොරොත්තු සහගත රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සහ සමහර ආන්දෝලනාත්මක සිද්ධීන් හටගත් කාලයක් විය.

එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයින් වන කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ සහ මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කෙහෙළිය රඹුක්වැල්ල යන මහත්වරු දෙපළ ආණ්ඩුවේ ඇමැතිධූර භාර ගනිමින් ආණ්ඩුව සමග එක්වීමත් සටහන් විරාම ගිවිසුම ශක්තිමත් කිරීම පිළිබඳ රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සාකච්ඡා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර දී ඇරඹීමට තීරණය කිරීමත් මෑත කාලයේදී මෙරට සිදුවූ නැවුම් මෙන්ම තීරණාත්මක සිද්ධීන් දෙකක් බව නොඅනුමානය.

එමෙන්ම දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නොකඩවා දින තුනක් තිස්සේ පාර්ලිමේන්තුව තුළ උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කරමින් පාර්ලිමේන්තුවේ වැඩකටයුතු කඩාකප්පල් කිරීමද පසුගිය දිනවල මෙරට සිදුවූ ආන්දෝලනාත්මක සිදුවීමක් බවට පත්විය.

ඇමරිකානු රාජ්‍ය දෙපාර්ථමේන්තුවේ සහය ලේකම් නිකලර්සි බර්න්සි මහතාගේ මෙරට සංචාරය මෙන්ම ඔහු මෙරටින් නික්ම යාමට පෙර එල්.ටී.ටී.ඊ. යට අනතුරු අඟවමින් කොළඹදී කළ ප්‍රකාශයත් ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු ඇමැතිවරයා ලංකාවේ උද්ගතව ඇති තත්ත්වය සම්බන්ධයෙන් කර තිබූ ප්‍රකාශයත් නව වසරේ ගෙවී ගිය දින කිහිපය තුළ රටේ සිදු වූ දේශපාලන සිදුවීම් කෙරෙහි අවධානය යොමු කරන කවරකුට වුව නොතකා හැරිය නොහැකි තවත් කාරණා කිහිපයකි.

රජය සහ එල්.ටී.ටී.ඊ. ය සංවිධානය සටන් විරාම ගිවිසුම පිළිබඳ සාකච්ඡා ඇරඹීමට තීරණය කිරීම මෙරට සියළුම දේශපාලන පක්ෂත් මුළුමහත් ජනතාවත් ජාත්‍යන්තර ප්‍රජාවත් මෙන්ම මෙකී නොකී සියළු පාර්ෂවයන්ගේ පැසසුමට මෙන්ම ඇගයීමට ලක්වන බලාපොරොත්තු සහගත තීරණාත්මක තීන්දුවක් බව පිළි නොගන්න කෙනෙකු ඇතැයි සිතීමටවත් නොහැකිය. සාකච්ඡා මේසයේදී සිය සංවිධානය රජයට කොන්දේසි හෝ විශේෂ ඉල්ලීම් ඉදිරිපත් නොකරන බව එල්.ටී.ටී.ඊ. න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් ප්‍රකාශ කර තිබුණද සාකච්ඡා මේසයේදී ඔවුන්ගේ හැසිරීම් කෙසේ වේදැයි අපට දැන්මම කිව නොහැකිය. එමෙන්ම රජයත් එල්.ටී.ටී.ඊ. සංවිධානයත් අතර සටන් විරාම ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා ඇරඹිය යුතු කාලය තුළ සහ සාකච්ඡා ඇරඹීමෙන් පසුව එම සංවිධානය උතුරු - නැගෙනහිර පළාත් වල කෙසේ හැසිරේදැයි දැන්මම යමක් ප්‍රකාශ කිරීමට තරම් කාලය වැඩිය. සටන් විරාම ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා ඇරඹීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය සිය කැමැත්ත පළ කළ පසුගිය 25 දා කිලිනොච්චි එල්.ටී.ටී.ඊ. දේශපාලන අංශ මූලස්ථානයේ පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී අදහස් දක්වා ඇති එල්.ටී.ටී.ඊ. න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් එදින ඇති කරගත් එකඟතාවයන් සමග උතුරු - නැගෙනහිර ප්‍රචණ්ඩ ක්‍රියා නතරවනු ඇති බවටද සහතික විය. එල්.ටී.ටී.ඊ. න්‍යායාචාර්යවරයා එවන් සහතිකයක් ලබා දුන්නද එල්.ටී.ටී.ඊ. සංවිධානය සමහර අවස්ථාවලදී හැසිරෙන ආකාරය හා කරන ප්‍රකාශ එකිනෙකට පරස්පර ස්වභාවයක් ගත් අවස්ථා එමටය. එබැවින් මෙවර එල්.ටී.ටී.ඊ. න්‍යායාචාර්යවරයා කර ඇති ප්‍රකාශය කොතෙක් දුරට ඔවුන් පිළිබඳියිද යන්න කිව හැක්කේ ඉදිරි දින කිහිපයේ කටයුතු සිදුවන ආකාරය නිරීක්ෂණය කිරීමෙන් පමණි.

කෙසේ වුවද සාකච්ඡා ඇරඹීමට රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය එකඟතාවයක් ඇති කර ගැනීමේදී රජය යෝජනා කළ ස්ථානයේ, එනම් ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර දී එම සාකච්ඡා ඇරඹීමට එම සංවිධානය එකඟ කරවා ගත හැකිවීම රජයේ විශේෂ ජයග්‍රහණයකි. නෝර්වේ ඔස්ලෝ නුවර දී එම සාකච්ඡා ඇරඹිය යුතු බවට එල්.ටී.ටී.ඊ. සංවිධානය දැඩි ස්ථාවරයක සිටියද ජිනීවා යාමට එකඟවීමට එම සංවිධානයට සිදුවිය. එය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් යයි සිතිය හැකිය. රට තුළ උද්ගතව ඇති තත්ත්වයන් සම්බන්ධයෙන් සාම ක්‍රියාවලියේ සම සභාපති රටවල් ඇතැයි ජගත් ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ මෙරට තානාපති ජෙෆර් ලන්සිටඩ් මහතාත් මෙරට සංචාරයක නිරත වූ ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තු සහය ලේකම් නිකර්ලර්සි බර්න්සි මහතා පසුගිය 23 දා පස්වරුවේ කොළඹ ගෝල්පේස් හෝටලයේ පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවේදීත් එල්.ටී.ටී.ඊ. සංවිධානයට අනතුරු අඟවමින් ප්‍රකාශ නිකුත් කරන තත්ත්වයකට පත්ව තිබුණි. ඔස්ට්‍රේලියානු විදේශ කටයුතු ඇමැතිවරයාද රජයට සහය පල කර ප්‍රකාශයක් නිකුත් කළ අතර ජිනීවා හි සාකච්ඡා පැවැත්විය යුතුය යන රජයේ යෝජනාව වෙනුවෙන් නෝර්වේ රජයද පෙනී සිටියේය. එම තත්ත්වයන් කළමණාකරණය කර ගැනීමේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දක්වා තිබෙන විනීතබව තවදුරටත් සූක්ෂමව පවත්වා ගැනීමට ජනාධිපතිවරයා ඇතුළු රජය වගබලා ගත යුතුව ඇත.

කළුතර දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී මෙන්ම එම පක්ෂයේ කළුතර දිස්ත්‍රික් නායකයා වශයෙන් කටයුතු කළ මහින්ද සමරසිංහ මහතාත්, මහනුවර දිස්ත්‍රික් එජාප නායකයා වශයෙන් කටයුතු කළ කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීවරයාත් පසුගිය 25 දා ආණ්ඩුවට එක්වීම මෑත කාලයේ සිදුවූ අනෙක් ආන්දෝලනාත්මක සිදුවීම මෙන්ම නව දේශපාලන සිදුවීමක් බවට පත්විය. ඔවුන් දෙපළ දිස්ත්‍රික් මට්ටමේ කැපී පෙනෙන එජාප නායකයින් දෙපළක් මෙන්ම ජාතික මට්ටමෙන්ද යම් ප්‍රතිරූපයක් ගොඩනගා ගත් එජාපයේ කැපී පෙනෙන දේශපාලන චරිත දෙකකි. ඔවුන් දෙපළ එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ සමීපතම මිතුරන් දෙපළක් වීමද විශේෂ ලක්ෂණයකි. මේ වනවිට ආණ්ඩුවට සම්බන්ධ වී ඇති එම දෙපළ මෙන්ම ඉදිරියේදී ආණ්ඩුවට එක්වීම සඳහා මේ වනවිට සාකච්ඡා කරමින් සිටින පිරිස අතර බොහෝ දෙනාද විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ පුද්ගලිකව මෙන්ම දේශපාලනිකව සමීපතවයන් වීමෙන් ඔහුට අද දෛවයේ සරදමකට මුහුණදීමට සිදුව ඇත. එය වෙනත් ලෙසකට පවසන්නේ නම් අද එක්සත් ජාතික පක්ෂය තුළ එම පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාට එරෙහිව කැරැල්ල පැන නැගී ඇත්තේ ඔහු තුළින්ම එසේ නොවේනම් ඔහු විසින්ම ගොඩනැගූ බලවේග විසින්ම යයි පැවසිය හැකිය.

එක්සත් ජාතික පක්ෂ නායකත්වයේ හා සංවිධාන ව්‍යුහයේ වෙනස්කම් ඇති කිරීම සඳහා ක්‍රියාත්මක වෙමින් තිබෙන එම පක්ෂ අභ්‍යන්තර අරගලයට ඇහුම්කන් දී පක්ෂයේ කළ යුතුව ඇති වෙනස්කම් කිරීමට එජාප නායකත්වය සූදානම් නොවන්නේ නම් රට තුළ දිස්ත්‍රික් මට්ටමේ හෝ පදනමක් සහිත පක්ෂ ජ්‍යේෂ්ඨයින් ගණනාවක් එක්සත් ජාතික පක්ෂයට අහිමිවීම වැළැක්විය නොහැකිය. එය එසේ වන්නේ නම් එය රනිල් වික්‍රමසිංහ මහතාට මෙන්ම එක්සත් ජාතික පක්ෂයට අභාග්‍ය සම්පන්න කාලයක් වනු ඇත. එවන්නක් සිදුවුවහොත් මාතර දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද විජේසේකර මහතා ප්‍රකාශ කර ඇති ආකාරයට එය රනිල් වික්‍රමසිංහ මහතාගේ අවාසනාව පක්ෂයේ අවාසනාව බවට පත්ව ඇතැයි කීමෙන් සෑහීමකට පත්වීමට නොහැකි වනු ඇත.

ජෝසප් පරරාජසිංහම් මහතාගේ ඝාතනය සහ උතුරු නැගෙනහිර පළාත්වල සිදුවනවා යයි කියන සමහර සිද්ධීන් සම්බන්ධයෙන් රජයට හා ආරක්ෂක අංශ වෙත චෝදනා එල්ල කරමින් දෙමළ ජාතික සන්ධානය පසුගිය 17 දා සිට 19 දා දක්වාම අඛණ්ඩ උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කිරීමත් පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කඩාකප්පල් කිරීමේ උත්සාහයක නිරත විය. 19 දා හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට බාධා නොකර පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සඳහා සහභාගි වන ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 18 දින රාත්‍රී එම සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කැඳවා කළ ඉල්ලීමද නොතකා හරින්න ඔවුන් එදිනද පාර්ලිමේන්තුවේ උද්ඝෝෂණ දියත් කරමින් එම වැඩකටයුතු වලට බාධා කළෝය. පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු විනාඩි පහකට සීමා වූ එදින හදිසි නීතිය දීර්ඝ කිරීම සම්මත කර ගැනීමට ආණ්ඩුවට සිදුවූයේ එම කලබල මධ්‍යයේයි. එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් ලකුණු දමා ගැනීම සඳහා නිරන්තරයෙන් සිය කටයුතු තීරණය කරන දෙමළ ජාතික සන්ධානය රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර ඇති කරගෙන ඇති නවතම එකඟතාවය හේතුවෙන් දැඩි අසීරුතාවයකට මුහුණපානවා නිසැකය. ජාත්‍යන්තර ප්‍රජාවගේ බලපෑම නිසා හෝ එල්.ටී.ටී.ඊ. ය සිය තීරණය එලෙසින්ම ක්‍රියාත්මක කරන්නේ නම් දෙමළ ජාතික සන්ධානයේ එවන් කටයුතු සඳහාද එම සංවිධානයෙන් තහංචි පැනවෙනවා නිසැකය.

ඒ අනුව නව වසරේ ගෙවීගිය කාලය තුළ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජයේ කටයුතු තව තවත් ශක්තිමත් කරන ආකාරයෙනුත් ඔවුන්ට වාසි සහගත ලෙසත් සියළු සාධක පෙළ ගැසෙමින් තිබෙන ආකාරයක් දක්නට ඇත. ඉතිහාසයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළු දේශපාලන පක්ෂ එකඟතාවයකට පැමිණ රටේ ප්‍රධානතම ප්‍රශ්නය වන ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් එකඟතාවයක් ඇති කර ගැනීම සඳහා සර්ව පාක්ෂික සමුළුවට සහභාගිවීම තවත් එක් ජයග්‍රාහී සන්ධිස්ථානයකි. ඉදිරි මග වැටී ඇත්තේ එම සියළු සාධක කළමණාකරණය කර ගැනීමට ජනාධිපතිවරයා ඇතුළු රජය දක්වන දක්ෂතාවය මතය.

**කාශ්‍යප මල්ලවආරච්චි**

## කරූ ගේ මාසය

